# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ
# මෝටර් රථ රියදුරන් III ශ්‍රේණියට බඳවා ගැනීම - 2018

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු තනතුරේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි පිරිමි අයැදුම්කරුවන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය මහනුවර නගරයේදී පමණක් හෝ අයැදුම්කරුවන් සංඛ්‍යාව හා ඔවුන්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය අනුව මහනුවර, මාතලේ හා නුවරඑළිය යන නගරයන්හිදී හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන පරිදි පැවැත්වේ.

## 1. පොදු සුදුසුකම්

### 1.1 විවෘත බඳවා ගැනීම්

1.1.1 අයැදුම්කරු ශ්‍රී ලාංකික විය යුතුය.

1.1.2 අයැදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.3 අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට ( 2018.08.30 ) පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. ( අයදුම් කරුගේ පදිංචිය ඡන්ද හිමි නාමලේඛනය මගින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය මගින් සනාථ කළ යුතුය )

1.1.4 සෑම අයැදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

1.1.5 අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

1.1.6 අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.

1.1.7 මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

1.1.8 දිවා කාලය හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

## 2. අධ්‍යාපන සුදුසුකම් ශිල්පීය නිපුණතා හා පළපුරුද්ද

මෙහි දැක්වෙන සියලු සුදුසුකම් 2018. 08 .30 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

### 2.1 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. ( වෛකල්පිත විෂයයන් හැර )

### 2.2 ශිල්පීය නිපුණතා

අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වසර 03 කට පෙර තාරබර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වෘත්තීය ප්‍රවීණතා බලපත්‍රයක් ලබා සිටිය යුතුය ( සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය)

### 2.3 පළපුරුද්ද

අදල ක්ෂේත්‍රය පිළිබඳ අවුරුදු 03 ක පලපුරුද්දක් තිබිය යුතුය. මෙම පලපුරුද්ද ලිඛිත ලියවිලි මගින් සනාථ කළ යුතුය. එය රජයේ හෝ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබාගත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය

## 3. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි PL 3 - 2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 25790 - 10X270 - 10 X 300 - 10 X 330 - 12 X 350 = රු. 38,990/-

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි 2018.01.01 දිනට වැටුප රු.20,462/-කි. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි ඉදිරි වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.)

## 4. බඳවා ගැනීමේ කොන්දේසි

මෙම තනතුරට අදාලව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

## 5. බඳවා ගැනීමේ ක්‍රමය

විවෘත බඳවා ගැනීම්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව සිදු කරනු ලැබේ. සියලු බඳවා ගැනීම් සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකදී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ද ප්‍රායෝගික පරීක්ෂණයට 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ද තිබිය යුතු අතර, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වල ලකුණු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

## 6. සේවා කොන්දේසි

6.1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් පිළිබඳව රජය විසින් කලින් කලට පනවනු ලබන නියමයන්ට යටත් වේ.

6.2. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 01/2014 හා ඊට අදාළ අනෙකුත් චක්‍ර ලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

6.3. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 03 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර, එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

## 7. අයැදුම් කිරීමේ ක්‍රමය

7.1 විභාග ගාස්තුව රු.600 /කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20- 03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබා ගත් ලදුපතක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7.2 අයැදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2018.08.30 දිනට පෙර ලැබෙන සේ ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2018"** සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගතවන අයැදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

## 8. විභාග මාධ්‍යය

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයැදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## 9. විභාග මධ්‍යස්ථානය.

විභාග මධ්‍යස්ථානය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයැදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

## 10. ලිඛිත විභාගය හා විෂය නිර්දේශය.

අයැදුම්කරුවන් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

මාර්ග නීති පිළිබඳ දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම - (කාලය පැය 02 යි)

| | |
|---|---|
| උපරිම ලකුණු ප්‍රමාණය | 100 |
| සමත් ලකුණු ප්‍රමාණය | 40 |

## 11. අයැදුම්පත් පිරවීම සඳහා උපදෙස්.

ආදර්ශ අයැදුම්පත් ආකෘතිය ප්‍රකාර A 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතුය.

11.1. අයැදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයැදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

11.2. අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු. 240360/- කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කල යුතුය.

11.3. යම් අයැදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11.4. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**12.** මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම /තීරණය කිරීම, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**2018 අගෝස්තු මස 14 වෙනි දින,**
**මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**අංක 244, කටුගස්තොට පාර,**
**මහනුවර.**

**ආර්.එම්.එන්. රත්නායක,**
**ලේකම්,**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**මධ්‍යම පළාත් සභාව.**

# ආදර්ශ අයදුම්පත්‍රය

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

විභාග අංකය ☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- ☐ ( සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E )
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)

පදිංචි දිස්ත්‍රික්කය : ☐

දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය ☐
මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03

01. 1.1 මුලකුරු සමග නම: ..............................
Mr (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමග නම: ..............................
මයා (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..............................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්): ..............................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..............................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..............................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................

2.4 දුරකථන අංකය : ..............................

03. 3.1 උපන් දිනය : ..............................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2018. 08 .30 ) වයස : අවු : .......... මාස : .......... දින : ..........

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ..............................

05. 5.1 අයදුම්කරුගේ ස්ථිර පදිංචිය පිළිබඳ තොරතුරු : ..............................

| ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාශය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. අධ්‍යාපන සුදුසුකම්:- අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

06.1 විභාග වර්ෂය : ..............................

06.2 විභාග අංකය : ..............................

06.3 ප්‍රතිඵල : : ..............................

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

07. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම : ..............................

ii. දිනය : ..............................

iii. කුවිතාන්සි අංකය : ..............................

( මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව මත අලවන්න )

### අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

..............................  ..............................
දිනය  අයදුම්කරුගේ අත්සන

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .............................. මහතා මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු අද දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

දිනය : ..............................  ..............................
සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ..............................

තනතුර : ..............................

ලිපිනය : ..............................